**කේ.එම්.එච්. සුදත් එ. ශ්‍රී ලංකා පොලීසිය, මහනුවර**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1163 /2019 (2019.07.30 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - කේ.එම්.එච්. සුදත්
**නොතිසි ලත් පාර්ශවය** - පොලිස්පතිතුමාගේ මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01
ස්ථානාධිපති, මහනුවර පොලිස් ස්ථානය, මහනුවර

**පෙනීසිටීම**
අභියාචක - කේ.එම්.එච්. සුදත්
පොදු අධිකාරිය - ඩී.පී. මධුෂංක, පොලිස් කොස්තාපල්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.08.29 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.09.25 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.10.15 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.08.29 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

1. *2016.02.16 දින කරන ලද පැමිණිලි අංක W.C.B. (2) 343/310 යටතේ නීතිපති උපදෙස් පතා ඇති ලිපි ගොනුවේ යොමු අංකය*
2. *2017/04/05 වන දින කරන ලද පැමිණිල්ලේ අංක W.C.I.B. (1) 350/54 යටතේ නීතිපති උපදෙස් පතා ඇති ලිපි ගොනුවේ යොමු අංකය*

*3. 2017/07/12 වන දින කරන ලද පැමිණිල්ලේ අංක W.C.I.B. (1) 237/157 යටතේ නීතිපති උපදෙස් පතා ඇති ලිපි ගොනුවේ යොමු අංකය*

තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියා නියමිත කාල සීමාව තුළ කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2018.10.15 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

පොදු අධිකාරිය විසින් සඳහන් කර සිටියේ අදාළ තොරතුරු අභියාචක වෙත ලබාදී ඇති අතර එහි පිටපතක් කොමිෂන් සභාවට රැගෙනවිත ඇති බවයි.

මීට ප්‍රතිචාර ලෙස අභියාචක සඳහන් කර සිටියේ පොදු අධිකාරිය විසින් අදාළ තොරතුරු ලබා දී ඇතත් තුන්වන අයිතමයට අදාළව ලබාදී ඇත්තේ සත්‍ය තොරතුරු නොවන බවත්ය. එය සනාථ කිරීම සඳහා 2017.12.26 ලිපිය මඟින් අදාළ ලේඛනය නීතිපතිගේ උපදෙස් සඳහා යොමුකර ඇති බවත්, 2018.01.28 දිනැති ලිපිය මඟින් පොලිස් අධිකාරීවරයා සඳහන් කර ඇත්තේ අදාල ලේඛනය නීතිපතිට යොමුකර ඇති අතර ඊට උපදෙස් තවමත් ලැබී නොමැති බවට දන්වා ඇති බවයි. ඒ අනුව පොදු අධිකාරිය විසින් 3 වන අයිතමයට අදාළව ලබාදී ඇති තොරතුරු සත්‍ය තොරතුරු ලෙස පිළිගත නොහැකි බව අභියාචක ප්‍රකාශ කර සිටී.

මෙම කරුණු දැක්වීම් සම්බන්ධව කොමිෂන් සභාව විසින් අවධාරණය කර සිටින්නේ තුන්වන අයිතමයට අදාළ තොරතුරුවල සත්‍යතාවය පිළිබඳ පරස්පරතාවක් ඇති බවයි.

**නියෝගය:**

ඒ අනුව 2017.12.26 දිනැති හා 2018.01.28 දිනැති ලිපි මඟින් සඳහන් කරුණු හා පොදු අධිකාරිය විසින් 3 වන අයිතමයට අදාළව ලබා දී ඇති තොරතුරු සම්බන්ධයෙන් වන පරස්පරතාවය පිළිබඳව කරුණු දැක්වීමට පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

ඒ අනුව මීළඟ අභියාචනය 2019.12.10 දින පෙ.ව. 11.00ට කල්තබන ලදි.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1163/19 (2019.12.10 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. හපුආරච්චි

**අභියාචක** කේ. එම්. එච්. සුදත්
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, පොලිස් මූලස්ථානය, කොළඹ

**පෙනීසිටීම**
අභියාචක - නොපැමිණි.
පොදු අධිකාරිය - එච්.එම්.එම්.ඩී.එච්. මොනොරන්ගි (ජ්‍යෙෂ්ඨ පරීක්ෂක - පොලිසිය)

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත 2019.12.07 දිනැති ලිපියක් ඉදිරිපත් කරමින් දක්වා සිටියේ අභියාචක විසින් ඉල්ලුම් කල ඇති සියලු තොරතුරු ලබා දී ඇති බව ය.

2019.12.07 දිනැති ලිපියෙන් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක (මහනුවර) විසින් කොමිෂන් සභාව වෙත ලිපියෙන් දන්වා තිබුණු කරුණු මෙසේ ය.

1. *"පැමිණිලිකරු වන කේ.එම්.එච්. සුදත් යන අය විසින් තොරතුරු දන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාලව පැමිණිල්ලක් කර ඇති අතර එම පැමිණිල්ලට අදාලව ලේඛන පරීක්ෂා කිරීමේදී මෙම සිද්ධියට අදාළ ගොනු නීතිපති තුමා වෙත යොමු කර ඇති බවට කරුණු අනාවරණය විය. ඒ සම්බන්ධ උදෘත ගොනු 2019.09.19 වන දින මාගේ බැහැර අංක 583/19 යටතේ දිස්ත්‍රික් භාර නිලධාරී තුමා මගින් යොමු කිරීමට කටයුතු කර ඇත. මෙතෙක් යොමු අංකය ලැබී නොමැත.*

2. *මේ සම්බන්ධයෙන් ඉහත සිද්ධියට අදාළ 2016.02.16 වන දින ඩබ්.සි.අයි.බී. (2) 243/310 දරන පැමිණිල්ල නීතිපති යොමු අංකය සි එච්/සිපි 01/34/17 පි පි වේ. ඩබ්.සි.අයි.බී. (1) 350/54 දරන පැමිණිල්ල නීතිපති යොමු අංකය සී එන්/සි පි /97/17 වේ.*

3. *මේ සම්බන්ධව අංශයේ නිලධාරීන් විමසීමේදී ඉහත සිද්ධීන් දෙක නීතිපති තුමා වෙත යොමු කර ඇති බැවින් ඩබ්.සි.අයි.බී. (1) 237/157 දරන පැමිණිල්ල නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇති බවට 2017.07.12 වන දින දන්වා ඇත.*

4. *ඒ අනුව එය අතපසුවීමකින් සිදු වූවක් බවට බතුමා වෙත කාරුණිකව දන්වා සිටින අතර ඉහත අනු අංක 01 යටතේ යොමු කර ඇති මෙම ලිපිය මගින් ඔබතුමා වෙත කාරුණිකව දැනුම් දෙමි. මින් ඉදිරියට එවැනි අතපසුවීම් සිදු නොවීමට වග බලා ගනිමි."*

**නියෝගය:**

තවද, තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 1 හි සඳහන් *"2016.02.16 දින කරන ලද පැමිණිලි අංක W.C.B. (2) 343/310"* යන්න අභියාචක විසින් නම් කල නිලධාරියා හට ඉදිරිපත් කරන ලද අභියාචනයේ හා පොදු අධිකාරිය විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද 2019.12.07 දිනැති ලිපියේ "*2016.02.16 දින කරන ලද පැමිණිලි අංක W.C. B. (2) 243/310"* ලෙස සටහන් කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී.

ඉහත සඳහන් තත්වයන් යටතේ, පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීමේ අයිතමයන් අංක 1,2 හා 3 යටතේ ඉල්ලා ඇති තොරතුරු ලබා දී ඇති බව පොදු අධිකාරිය විසින් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද 2019.12.07 දිනැති ලිපියෙන් තහවුරු වන බවින් මෙමඅභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
****